// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2488/06 - 2026 මැයි මස 11 වැනි සඳුදා - 2026.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### කෑගල්ල මහා නගර සභාව

විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1984 අංක 12 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් කෑගල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා හල් හැර විනෝද බදු ආඥා පනතෙහි විස්තර කර ඇති කාර්යයන් සඳහා අය කරනු ලබන විනෝද බදු ප්‍රතිශතය 10% ලෙස පනවා අය කිරීමට, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, කෑගල්ල නගර සභාව විසින් 2025.07.09 වන දින පැවති මාසික මහා සභාවේ දී තීරණ අංක 2025/07/09/ඉ/07 යටතේ සම්මත කර ඇති යෝජනාව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර චම්පා ජානකී රාජරත්න වන මම, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**ඒ. ඒ. චම්පා ජානකී රාජරත්න,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2026 මැයි මස 06 වැනි දින,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

***යෝජනාව***

කෑගල්ල මහා නගර සභාවේ සැණකෙළි හා සංදර්ශන සඳහා මේ වන විට විනෝද බදු අය කර ගැනීම පිළිබඳව 2023.03.10 වන දින මහා සභා රැස්වීමේ තීරණ අංක 4-11 යටතේ 25% ප්‍රමාණයක් දක්වා ඇති අතර, සැණකෙළි සංදර්ශන සඳහා මේ වන විට ඉල්ලීම් කිරීම සාපේක්ෂව අඩු වී ඇති බැවින් ලැබෙන්නා වූ ආදායම ද අහිමිවීමක් සිදුවන බැවින් පවත්නා විනෝද බද්ද 2024.12.27 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති බැවින් ද සිනමාහල් හැර විනෝද බදු ආඥාපනතට අයත් අනෙකුත් ක්ෂේත්‍ර මගින් අය කරනු ලබන විනෝද බද්ද 10% දක්වා අඩු කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

EOG 05 - 0118

1A - PG 7696 — 04 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1984 අංක 12 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිනමා හල් හැර විනෝද බදු ආඥාපනතෙහි විස්තර කර ඇති කාර්යයන් සඳහා අය කරනු ලබන විනෝද බදු ප්‍රතිශතය 12% ලෙස පනවා අය කිරීමට, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025.10.14 වන දින පැවති මාසික මහා සභාවේ දී තීරණ අංක 2025/10/14/17-1 යටතේ සම්මත කර ඇති යෝජනාව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර චම්පා ජානකී රාජරත්න වන මම, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**ඒ. ඒ. චම්පා ජානකී රාජරත්න,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2026 මැයි මස 06 වැනි දින,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

***යෝජනාව***

මාවනැල්ල ප්‍රාදේශීය සභවේ දැනට පවතින 25% ක විනෝද බදු ප්‍රතිශතයක් තීරණය කර සම්මත කරගෙන ඇත. එම බදු ප්‍රතිශතය පනතේ සඳහන් උපරිම සීමාව දක්වා තීරණය කර තිබීම හේතුවෙන් ප්‍රසංග හා සංදර්ශන ඇතුළු අදාළ කාර්යයන් සිදුකරන පාර්ශවයන් ඒ සඳහා යොමු වීමේ අඩු ප්‍රවනතාවයක් ඇත. එබැවින් එම 25% ප්‍රතිශතය අඩුකර එකී කාර්යයන් ප්‍රවාර්ධනය කර ඒ සඳහා උත්තේජනයක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු අතර සභාව විසින් 25% බදු ප්‍රතිශතයක් සඳහා ගෙන ඇති මහා සභා තීරණය මෙම යෝජනාව මගින් පරිච්ඡින්න කරමින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) උපවගන්තියෙන් ලබා දී ඇති බලතල ප්‍රකාරව 12% ක විනෝද බදු ප්‍රතිශතයක් පනවා අය කිරීම සුදුසු බවත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවට වන සංශෝධිත යෝජනාව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

EOG 05 - 0119

---

**ගලිගමුව ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1984 අංක 12 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විනෝද බදු ප්‍රතිශතය 10% ලෙස පනවා අය කිරීමට, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් 2026.01.02 වන දින පැවති මාසික මහා සභාවේ දී තීරණ අක 2026/01/ඊ -05 යටතේ සම්මත කර ඇති යෝජනාව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර චම්පා ජානකී රාජරත්න වන මම, 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**ඒ. ඒ. චම්පා ජානකී රාජරත්න,**
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර.

2026 මැයි මස 06 වැනි දින,
සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*යෝජනාව*

ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1946 අංක 12 දරන විනෝද බදු පිළිබඳ ආඥාපනතේ 2(1) වගන්තියේ බලතල ප්‍රකාරව ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව මෙතෙක් පනවා අය කරනු ලැබූ 25% වූ විනෝද බදු ප්‍රතිශතය 2026 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට 10% ප්‍රතිශතයක් දක්වා අඩුකර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව පනවා අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

EOG 05 - 0120

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.